02
පාඩම

# මම නමදිමි සදහම් පහදා සිතු

"ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඕපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි"

ශ්‍රී සද්ධර්මය තථාගතයන් වහන්සේ විසින් මනා කොට දේශනා කරන ලද බැවින් ස්වාක්ඛාත ය, ඒ සද්ධර්මයෙන් දේශනා කෙරෙන අර්ථය තමා විසින් ම දැක්ක යුතු බැවින් සන්දිට්ඨික ය. සද්ධර්මය අනුගමනය කිරීමෙන් ලැබෙන සෝවාන් ආදී සතර මාර්ග කල් නොයවා පල දෙන බැවින් අකාලික ය. සතර මග, සතර ඵල, නිවන යන නව ලෝකෝත්තර ධර්මය එන්න, බලන්න කියා දැක්විය හැකි, සැඟවුණු කාරණයක් නොවන බැවින් එහිපස්සික ය. සෝවාන් ආදී නව ලෝකෝත්තර ධර්ම තම සිත තුළ ම එළවා ගත යුතු, උපදවාගත යුතු බැවින් හෝ ඕපනයික ය. ඥාණවන්තයන් විසින් නව ලොව්තුරා දහම තම තමන් ම අවබෝධ කර ගත යුතු හෙයින් **පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී** ය.

## සන්දිට්ඨිකො

සෝවාන් ආදී ආර්ය මාර්ගයෙන් සිදුවන්නේ තමාගේ සන්තානයේ ඇති කෙලෙස් සංසිඳුවීම ය. එසේ කෙලෙසුන් සංසිඳෙන සංසිඳෙන තරමට එහි සුවය දැනෙන්නේ ද තමාට ම ය. එහෙයින් ආර්ය මාර්ගය සන්දිට්ඨික ය. එසේ ම නවලොව්තුරා දහම ද අනුන් කෙරෙහි විශ්වාසයෙන් ගොස් ලබා ගත හැක්කක් නොවේ. තමාගේ ම ඥාණයෙන් අවබෝධ කර ගත යුත්තකි. එහෙයින් ද සන්දිට්ඨික නම් වෙයි. තව ද ලෝකයේ නොයෙකුත් ආගම් ඇත. දෙවියන් ඇත. ඔවුන් කියන විමුක්ති ඇත. දිව්‍ය ලෝක ඇත. එහෙත් ඒ කිසිවෙකු හෝ ඒ කිසිවක් තමාට දැක්ක නොහැකි ය. එහෙත් මේ තථාගත ධර්මයෙන් පෙන්වන මාර්ගය සහ නිර්වාණ ඵලය තමාට මෙලොව දී ම අත්දැකිය හැක්කකි. රහතන් වහන්සේ නමක් පිරිනිවන් පාන්නේ ඒ අත්දැකීම මෙලොව දී ම ලබා ගෙන ය. එහෙයින් තමාට ම මෙහිදී ම අත්දැකිය හැකි බැවින් මේ ධර්මය **සන්දිට්ඨික** ය.

## අකාලිකො

සෙසු කුසල කර්ම මෙන් ම අකුසල කර්ම ද සැමවිට එවලේ ම විපාක දෙන්නේ නැත. **"නහි පාපං කතං කම්මං - සජ්ජු ඛීරං ව මුච්චති"** යනුවෙන් පැවසෙන පරිදි පාපකර්මයක් වුව ද කිරි මිදෙන්නා වැනි ය. එවෙලේ නොමිදේ, පල නොදේ. දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරියවේදනීය යන කවර ලෙසකින් වුව ද විපාක දෙන්නේ පසුව ය. එහෙත් සෝවාන් ආදී සතර මාර්ගවලට පත්වීමත් සමග ම ඵලය ද ලැබේ. එහෙයින් මේ ධර්මය **අකාලික** ය.

## එහිපස්සිකො

අංගුත්තර නිකායේ තික නිපාතයේ හරණ්ඩු වර්ගයේ දී වැසී ආවරණය වී තිබීම නිසා රැකෙන කාරණා තුනක් කියැ වේ. එනම් කාන්තාවත් බ්‍රාහ්මණයන්ගේ මන්ත්‍ර සහ මිථ්‍යාදෘෂ්ටියත් ය. ඒ නිසා ලෝකයේ කිසි ම ආගමක් එන්න බලන්න යැයි විවෘතව කීමට සමත් නොවේ. ආවරණය නොවී විවෘතව තිබුණු තරමට බැබලෙන කාරණා තුනක් ද එම සූත්‍රයේ සඳහන්ව ඇත. එනම්, ඉරමඬලත්, සඳමඬලත්, තථාගත ධර්මයත් ය. **"තථාගතප්පවෙදිතො ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො"** යනුවෙන් ඒ බව පැවසේ. එසේ ම බුදුරජාණන් වහන්සේ ධර්මය හඳුන්වා දෙන්නේ **"ආදි කල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං"** මුල මැද අග යහපත් ය, අර්ථවත් ය, මනා නිවැරදි භාෂාවෙන් යුක්ත ය, හැම අතින් ම පරිපූර්ණ ය, පිරිසිදු ය යනුවෙනි. එන්න බලන්න යැයි විවෘතව කිව හැක්කේ ඒ නිසා ය. එසේ කිව හැකි ලොව ඇති එකම ධර්මය බුද්ධ ධර්මය යි.

## ඕපනයිකො

**උපනය+ඉක - ඕපනයික** - උපනය යනු එළවාගත යුතු පමුණුවාගත යුතු යන අදහස දෙයි. සෝවාන් ආදී මාර්ග ඵල ධර්ම භාවනා වශයෙන් වැඩීමෙන් තම සිතට පමුණුවා ගත යුතු වන බැවින් ඕපනයික නම්. එසේ ම මෙම මාර්ග ඵල ධර්ම ප්‍රත්‍යක්ෂ කිරීමෙන් ම නිර්වාණයට පමුණුවන බැවින් ද නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන බැවින් ද ඕපනයික යැයි කියනු ලැබේ.

## පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි

මෙම මාර්ග ඵල ඔස්සේ නිවන් අවබෝධය අනිකෙකු ලවා කරවිය නොහැකි ය. තමා ම ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් ම අවබෝධ කළ යුතු ය. එය ද සම්මා දිට්ඨි සම්මා සංකප්ප වශයෙන් ඥාණය ඇති කෙනෙකු විසින් ම මිස ඒ නුවණ නැතියෙකුට අවබෝධ කළ නොහැකි ය. ආචාර්ය උපාධ්‍යායන් වහන්සේ හෝ වෙනත් කෙනෙකු භාවනා වැඩීමෙන් ශිෂ්‍යයාට (අතවැසියාට) මාර්ගඵලාවබෝධය සිදු නොවේ. ඒ ඒ පුද්ගලයා තම තමන්ගේ ශ්‍රද්ධා වීර්ය සති සමාධි ප්‍රඥා ධර්මයන්ගේ ප්‍රමාණය අනුව තමා විසින් ම අවබෝධ කළ යුත්තේ ය. අත්දැකිය යුත්තේ ය. එහෙයින් සද්ධර්මය **විඤ්ඤූහි පච්චත්තං වෙදිතබ්බො** හෙවත් ඥාණවන්තයින් විසින් වෙන වෙන ම තම තමා ම අවබෝධ කළ යුත්තකැයි කියනු ලැබේ.

**අභ්‍යාස**

01. ධර්ම රත්නයේ ගුණ පිළිබඳ කියවෙන කවි කට පාඩම් කරගන්න.
02. ඔබ කැමැති ධර්ම රත්නයේ ගුණයක් උපයෝගී කරගෙන කතාවක් පවත්වන්න.
03. ධර්ම රත්නයේ ගුණ හා එහි තේරුම් මතකයෙන් ලියන්න.